පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 19 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012ජුනි 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනවල වූ වෙනත් ආදායම් අය ශීර්ෂය තුල රු.1,518,913 ක ප්‍රාග්ධන ලැබීම් ඇතුලත්ව තිබීමෙන් වෙනත් ආදායම් රු.1,518,913 කින් වැඩියෙන් හා ප්‍රාග්ධන ආදායම් එපමණකින් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ආ). වර්ෂයට අදාල උසාවි දඩ හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබූ අතර, 2012 මාස 2 කට ලද උසාවි දඩ රු.3,076,853 ක් හා මුද්දර ගාස්තු රු.1,725,418 ක් වර්ෂයේ උසාවි දඩ ලැබීම් ලෙස ගෙන තිබූ අතර, ඉකුත් වර්ෂ වෙනුවෙන් උසාවි දඩ ලැබී නොතිබුණද ඉකුත් වර්ෂ හිඟ ලැබීම් ලෙස රු.600,000 ක් අඩුකර රු.4,202,271 ක් වර්ෂයට අදාල උසාවි දඩ ආදායම ලෙස ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම 2012 හා 2013 ජනවාර් වෙනුවෙන් 2013 වර්ෂයේ ලැබී තිබූ රු.6,538,956 ක උසාවි දඩ මුදලින් සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු ප්‍රමාණය හඳුනාගෙන ණයගැතියන් යටතේ ප්‍රතිපාදනය කරද නොතිබුණි.

(ඇ). වර්ෂයට අදාල මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබූ අතර අදාල ලේඛන අනුව 2010 වර්ෂයට අදාලව රු.2,000,000 ක් හා 2011 වර්ෂයට අදාලව රු.281,750 ක් 2013 වර්ෂය තුල ලැබී තිබූ අතර එකී වටිනාකම් ණයගැති කර නොතිබූ අතර වර්ෂයට අදාල මුද්දර ගාස්තු ප්‍රමාණයද ණයගැති කර නොතිබුණි. එමෙන්ම වර්ෂය තුල මුද්දර ගාස්තු ලෙස ලැබී තිබූ රු.1,725,418 ක්

උසාවි දඩ ලෙස ගිණුම් තැබීම නිසා උසාවි දඩ එපමණකින් වැඩියෙන් හා මුද්දර ගාස්තු එපමණක් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඈ). වර්ෂයේ මුද්දර ගාස්තු අයශීර්ෂයට රු.72,556 ක් බැර කර එයින් පෙර වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු ලෙස රු.5,000,000 ක් අඩුකර දැක්වීම හේතුවෙන් මුද්දර ගාස්තු අයශීර්ෂයෙන් රු.4,927,444 ක ඍණ ශේෂයක් පැන නැග තිබූ අතර, ඒ හේතුවෙන් ආදායම් හා වියදම් ගිණුමේ සේවා ගාස්තු ආදායම රු.2,102,532 ක ඍණ අගයක් ගෙන තිබුණි.

(ඉ). ලේඛන අනුව ජල ගාස්තු බිල් කිරීම් රු.1,551,996 ක් වුවත් වර්ෂය තුල ලැබී තිබූ රු.592,054 ක ප්‍රමාණය පමණක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබීමෙන් ජල ගාසතු ආදායම රු.959,942 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. ජල ගාස්තු ලේඛනය අනුව වූ හිඟය රු.1,545,788 ක් වූ අතර එකී හිඟය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඊ). අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.4,852,150 ක ප්‍රමාණයට අදාල ව්‍යාපෘතීන් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව රු.4,852,150 මුළු ප්‍රමාණයම ණය හිමියන් යටතේ ගිණුම් ගතකර තිබුණි.

(උ). මූල්‍ය ප්‍රකාශන අනුව ණයහිමි ශේෂය වූ රු.53,951,615 තුල 2012 වර්ෂය වන විට නිරවුල් වී පැවති 2009 වර්ෂයට අදාල රු.3,740,585 ක්ද 2010 ට අදාල රු.9,417,761 ක් හා 2011 වර්ෂයට අදාල රු.7,513,060 ක් තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ ණයහිමියන් රු.20,671,406 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඌ). ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වැය වෙනම හඳුනාගැනීමකින් තොරව වර්ෂය තුල ලැබී තිබූ රු.53,533,107 ක් හා ගෙවා තිබූ රු.63,511,186 පමණක් ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වැය ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.124,864,827 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,042,545 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,690,504 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වර්ෂය අවසානයට රු.161,144 ක අයවීම හිඟ හිට ඇති සේවක ණය ශේෂ 21 ක් පැවති අතර එයින් රු.65,250 ක් වූ ණය ශේෂ 2 කට අදාලව පුද්ගලයන් හඳුනාගෙන පැවතියද, අයකර ගැනීම ගැටළුකාර වී තිබුණි. රු.95,894 ක් වටිනා ඉතිරි ණය ශේෂයන් 19 ට අදාලව, අදාල පුද්ගලයන් වර්තමානය වන විට සේවය කරන ස්ථාන හඳුනාගෙන නොතිබුණි.

(ආ). සභාව විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවිය යුතු දීර්ඝ කාලයක සිට පැවත එන රු.1,389,432 ක ශේෂයක් පැවති අතර ඒ පිළිබඳ පරීක්ෂා කර නිරවුල් කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,072 | 673 | 587 |
| (ii) | බදුකුලී | 13,951 | 13,073 | 498 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,245 | 14,799 | - |
| (iv) | වෙනත් ආදායම් | 45,512 | 25,318 | 40,388 |

2.3.2 බදුකුලී

වර්ෂ අවසානයට පැවති බදුකුලී හිඟය වූ රු.418,047 තුල 2006 හා 2007 වර්ෂ වල සිට පැවත එන රු.273,284 ක් අයවී නොතිබුණි.

2.3.3 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

(අ). 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති අංක 59 ප්‍රකාරව ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමට අදාලව සභාව විසින් සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාර කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර කටයුතු කිරීමක්ද කර නොතිබුණි.

(ආ). සභා බල ප්‍රදේශය තුළ පවතින සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිව පවතින හෝටල් වලින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව එම හෝටලයේ පිරිවැටුම මත 1% කට නොවැඩි වන ගාස්තුවක් අයකර ගතහැකි වුවද, සභාව විසින් හඳුනාගත් එක් හෝටලයක් වෙනුවෙන් පමණක් 2010 වර්ෂයේ සිට රු.3,000 බැගින් වූ ගාස්තුවක් පමණක් අයකර තිබුණි.

2.3.4 <u>ජල ගාස්තු</u>

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.1,545,788 ක් විය. කුරුණෑගල පාරේ ජල පාරිභෝගිකයන් ට අදාලව සිදුකල නියදි පරීක්ෂාව අනුව ජල පාරිභෝගිකයන් 18 කුගෙන් අයවිය යුතු ශේෂය රු.402,004 ක් ලෙස පැවතියද, ඒවා අයකිරීමට හෝ සැපයුම විසන්ධි කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. නිසි පරිදි ගිවිසුම් වලට එළඹී නොතිබීමෙන් අදාල හිඟ මුදල් අය කිරීමද අවිනිශ්චිත තත්වයක පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සභාවේ ජල අංශයට වර්ෂය තුල ජලය ලබාගැනීම වෙනුවෙන් රු.1,904,835 ක් වැයකර තිබුණු අතර, වාර්ෂික ජල බිල්කිරීම් රු.1,551,996 ක් වූයෙන් තොග ජලය මිලදී ගැනීම් යටතේ සභාවට අතිරේකව රු.352,839 ක් දැරීමට සිදුව තිබුණි. ඒ යටතේ ජල පාරිභෝගිකයන් 475 කට පමණ අදාලව ජල සැපයුම් ලබාදී තිබුණද, ජල සම්බන්ධතා 42 කට අදාල ජල මනු අක්‍රියව පැවතිබවත්, එකී ජල පාරිභෝගිකයන්ගේ පූර්ව මාස වල ජල පාරිභෝජනයේ සාමාන්‍ය සලකා ගාස්තු අයනොකර පොදුවේ මාසිකව රු.50 බැගින් ජල ගාස්තු බිල්කර තිබූ බවත් විගණයේදී නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.1,545,788 ක හිඟය පිළිබඳ කාලවිශ්ලේෂණ ලබාදීමට සභාව අපොහොසත් විය.

2.3.5 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශයට අදාලව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 2 කට අදාල තොරතුරු පමණක් ලේඛන ගතව පැවති අතර, එකී කුළුණු වෙනුවෙන් රු.200,000 බැගින් පෙරසැරි ගාස්තු අයකර තැන්පතු ගිණුමට බැර කර තිබූ අතර ව්‍යාපාර බලපත්‍ර හෝ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. එමෙන්ම කාලානුරූපීව සමීක්ෂණයක් සිදුකර සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුනු පිළිබඳව හඳුනා ගැනීමක් සිදුකරද නොතිබුණි.

2.3.6 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ වාහන නැවැත්වීමට අදාල අතුරු ව්‍යවස්ථාවක් පැවතියද ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් සිදුකර සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමක් සිදුකර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.3.8 කඩකාමර බදුදීම

(අ) හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක 12 කඩ කාමරය බදු ගැනීම සඳහා පිළිවෙලින් රු.776,000 හා රු.693,100 බැගින් මිල ගණන් දෙකක් ඉදිරිපත් කර තිබූ අතර, ටෙන්ඩර් පිරිනැමීමේදී නිශ්චිත හේතුවක් නොදක්වා දෙවන මිල ගණන ලෙස වූ රු.693,100 ක් වූ මිල ගණන සභාව විසින් පිළිගෙන තිබුණි. එහෙත් එකවර ගෙවීමට අදාලව සභාව අත්සන් කල ගිවිසුම රු.776,000 කට ඉල්ලුම් කල බදුකරු නමින් එළඹ තිබුණි. සභාව විසින් ඉහත පරිදි ටෙන්ඩර්කර ලබාදුන් පාර්ශව වලින් පරිබාහිර පුද්ගලයින්ගෙන් එකවර ගෙවන මුදල් හා කුලී මුදල් ලබාගැනීම හේතුවෙන් වර්තමානය වන විට එකී කඩ සම්බන්ධව ගිවිසුම් ගතවීම ගැටළුකාරී වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේ ආසියානු සංවර්ධන ව්‍යාපෘති ණය ආධාර යටතේ රු.41,128,218 ක් වැයකර 2011 අග භාගයේ වැඩ නිමකර තිබූ පඩුවස්නුවර බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අදාල කාලවකවානු වල තක්සේරු කරවා නොගැනීම හේතුවෙන් ටෙන්ඩර් කර බදුදී නොතිබුණි. කඩ කාමර 4 ක් රු.30,000-50,000 අතර මාසික කුලියකට සභා තීරණයක් මත ලබාදී තිබුණද, ලිඛිත ගිවිසුම් වලට එළඹ නොතිබීම හේතුවෙන් නිශ්චිත තක්සේරුවක් කල පසු අදාල ගාස්තු අයකර ගැනීම ගැටළු සහගත විය හැකිව පැවතිණි. ණය වාරික හා පොලී ලෙස 2012 වර්ෂයේදී රු.1,198,391 ක් ගෙවා තිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

(අ). මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.94,823,211 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය ප්‍රකාරව සියළු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ). ලීබඩු හා සවිකිරීම් සමීක්ෂණය කර තිබුණ ද එකී වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අගය කර නොතිබුණි. ලෙජර් ගිණුම් අනුව එකී වත්කම් වල වටිනාකම රු.4,368,612 ක් විය.ලෙජර් ගිණුම් අනුව පැවති යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.15,036,700 ක් හා මොටර් රථ හා කරත්ත රු.10,309,035 ක් සමීක්ෂණය කල බවට හඳුනාගත නොහැකි විය.

2.5 මානව සම්පත් කළමනාකරණය

සභාවේ අනුමත සේවක මණ්ඩල සංඛ්‍යාව 81 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 69 ක් වූයෙන් පුරප්පාඩු 12 ක් පැවති අතර, එතුල වූ පුස්තකාලයාධිපති තනතුරු 02 න් 01 ක් පුරප්පාඩුව පැවතුණි.

මීට අමතරව තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනමට පුද්ගලයන් 19 කු බඳවාගෙන සහා අරමුදලින් වැටුප් ගෙවමින් පැවතුණි.

2.6 <u>සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). හෙට්ටිපොළ ගවමස් කඩයෙහි 2006 වර්ෂයට අදාලව පැවති රු.151,125 ක හිඟය සඳහා වූ නඩු තීන්දුව අනුව බදුකරුගේ දේපල විකුණා අදාල මුදල් අයකර ගැනීමට 2011 වර්ෂයේදී පිස්කල් වෙත නියෝග දුන් බව වාචික කරුණු පැහැදිලි කිරීම් අනුව සඳහන් වුවද, එකී උපදෙස් පරිදි කටයුත කර අදාල හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි.

(ආ). මඩිගේ අනුක්කනේ ගවමස් කඩයෙහි 2006 හා 2007 වර්ෂ වලට අදාලව පවතින රු.146,020 ක හිඟය සම්බන්ධව නඩුවෙහි අදාල බදුකරු විදේශ ගතවී ඇති බව අනාවරණය වූ අතර ඒ සම්බන්ධව පසු විපරමක් සභාව විසින් කර නොතිබුණි.

(ඇ). හෙට්ටිපොළ කකුල් මස් කඩයෙහි 2007 වර්ෂයට අදාල රු.71,975 ක හිඟය සම්බන්ධ නඩුවට අදාල තීන්දුව පරිදි රු.5,000 බැගින් සභාවට ගෙවීමට බදුකරුට නියෝග කර තිබූ නමුත්, වාරික 6 ක් ගෙවා 2012 අගෝස්තු සිට ගෙවීම් පැහැර හැර තිබුණද රු.41,975 ක හිඟය අයකිරීමට නැවත කටයුතු කර නොතිබුණි.

(ඈ). 1993 වර්ෂයේදී වයඹ ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලය විසින් සභාවට පවරන ලද ඉඩමේ පිහිටි ගොඩනැගිල්ලක බාහිර පුද්ගලයකු විසින් අනවසර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් 2010 වර්ෂයේ නඩු පවරා තිබුණ ද එකී නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) පළාත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් ලද ආධාර යටතේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිමකරන ලද පඩුවස්නුවර බහුකාර්ය ගොඩනැගිල්ල වෙනුවෙන් වූ රු.41,022,051 ක කොන්ත්‍රාත් වටිනාකම තුල ඇතුලත් රු.4,395,219 ක එකතු කළ අගය මත බදු ප්‍රමාණය සභාව විසින් බදු ගණනය කිරීමේදී ගෙවූ බදු ලෙස සලකා නොතිබුණි.

(ආ). සභා අරමුදල් යටතේ 2008-2011 කාල පරිච්ඡේදය තුල ඉදිකරන ලද සභා කාර්යාල ගොඩනැගිල්ලට අදාලව 2011 හා 2012 වර්ෂ වල කොන්ත්‍රාත්කාර සමාගමට පිළිවෙලින් රු.3,856,035 ක් හා රු.2,009,447 ක් ගෙවා තිබූ අතර ඊට ඇතුලත් වූ රු.485,467 ක් හා රු.574,226 ක් වූ එකතු කළ අගය මත බදු ප්‍රමාණය එකී වර්ෂ වල බදු ගණනයේදී ගෙවූ බදු ලෙස සලකා නොතිබුණි.

(ඇ). සභාවේ කුට්ටිගල් ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රු.400,000 ක මුදලක් ප්‍රදානය කර තිබූ අතර, එකී මුදලින් 2011 නොවැම්බර් 25 දින රු.275,500 ක් වැය කරමින්

කොන්ක්‍රීට් කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍ර දෙකක් හා 2012 ජුලි 10 දින රු.124,500 ක් වැයකරමින් කුට්ටිගල් සෑදීමේ ලෑලි තට්ටු මිලදී ගෙන තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. එහෙත් 2012 වර්ෂය තුළදී සභාව මගින් මගනැගුම වැඩසටහන යටතේ පමණක් මාර්ග 20 ක් වෙනුවෙන් රු.250,000 ක වටිනාකමට කුට්ටිගල් මිලදීගෙන තිබුණි.

2.8 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශයේ එකතුවන කසල, අක්කර 10 ක් පමණ වූ පෞද්ගලික ඉඩමක වලවල් කපා වැළලීම සිදුකර තිබූ අතර කසල කළමනාකරණ ව්‍යාපෘතියක් හෝ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියක් සභාව විසින් සිදුකර නොතිබුණි.

2.9 <u>කාර්ය සාධනය</u>

වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.26,573,000 ක් වටිනා සුභසාධන හා ප්‍රාග්ධන ව්‍යාපෘති 8 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය

(උ) වාහන උපයෝජනය